රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 197(1/1)

මගේ අංකය: පේ/බී 02/9/19.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
ආයතන අංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1982 මැයි මස 05 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

රජයේ නිවාසවල පදිංචිකරුවන්ගේ නිවාස කුලිය
අයකර ගැනීම.

---

අංක 197 සහ 1981.12.29 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 (xx1) ඡේදය පදනම් කරගෙන, ආයතන සංග්‍රහයේ x1x වැනි පරිච්ඡේදයේ 5 වැනි ඡේදය ඉවත්කර, පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ. ඒ අනුව 1982 ජනවාරි 01 දින සිට පහත සඳහන් පරිදි රජයේ නිවාස සඳහා කුලිය අයකළ යුතුය. (එම ඡේදයේ "පදිංචිය සඳහා ගෙවල් කුලී ගෙවීමක් නැතිව නොමිලයේ" වෙනුවට "උපලේඛනගත" යන්න යොදා ඇති බව සලකනු මැනවි.)

<u>5. ගෙවල් කුලී</u>

| | | |
|---|---|---|
| නව ඒකාබද්ධ වැටුප මත බව. | 5:1 | ආණ්ඩුවේ නිවාසවල පදිංචිය සඳහා කුලී අයකරන්නේ නිලධාරියාගේ නව ඒකාබද්ධ වැටුපට අනුව පහත සඳහන් උපවගන්තිවල දැක්වෙන පදනම මතය. |
| | 5:2 | <u>උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් නැති නිලධාරියෙකු.</u> |
| ස්ථිර නිවාස. | 5:2:1 | විවාහක නිලධාරියෙකුගෙන්: නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 10(දහය)කි.<br>අවිවාහක නිලධාරියෙකුගෙන්: නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 (හය) කි. |
| අර්ධ ස්ථිර නිවාස. | 5:2:2 | නිලධාරියා විවාහක වුවත්, අවිවාහක වුවත්, නිවාසයේ තක්සේරු ගෙවල් කුලිය පමණි. |
| තාවකාලික නිවාස. | 5:2:3 | කූඩාරම් වැනි තාවකාලික නිවාස.- අයකර නොගත යුතුය. |
| සාද නිවාස. | 5:2:4 | ආර්ථික කුලිය, එහි පදිංචි සෑම නිලධාරියෙකුගෙන්ම එක හා සමාන කොටස් වලින් අයකරගත යුතුය. |
| | 5:3 | <u>උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් ඇති නිලධාරියෙකු.</u> |
| | 5:3:1 | විවාහක නිලධාරියෙකුගෙන්: නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 8 (අට) කි.<br>අවිවාහක නිලධාරියෙකුගෙන්: නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 4 (හතර) කි. |

/2 ...

5:3:2 නිවාසයක් දීම වෙනුවට, නිලධාරියකුට විශේෂ ගෙවල් කුලී දීමනාවක් ගෙවන්නේ නම් හෝ ගෙවල් කුලිය වශයෙන් සැබැවින්ම ඔහු දරණ වියදම ප්‍රතිපූරණය කිරීමට ඔහුට මුදලක් ගෙවන්නේ නම් හෝ 5:3:1 උප වගන්තියේ සඳහන් පරිදි ඔහුගෙන් මුදල් අයකර ගත යුතුය.

කැමැත්ත ප්‍රකාශ කිරීම.

5:3:3 ඉහත 5:3:2 උප වගන්තියේ සඳහන් ප්‍රතිපූර්ණ මුදල හෝ විශේෂ ගෙවල් කුලී දීමනාව හෝ නොලබා, ස්වකීය සම්පූර්ණ නව ඒකාබද්ධ වැටුප ලබා ගැනීමට කැමැති බව ප්‍රකාශ කිරීමට එබඳු නිලධාරියකුට පුළුවන.

අඹුසැමි යුවලක්.

5:4 <u>රජයේ සේවයේ නියුතු වූ අඹුසැමි යුවලක් රජයේ නිවාසයක පදිංචිව සිටින අවස්ථාවලදී</u>.- උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් ඇතිනම්, ඒ දෙදෙනාගෙන් වැඩි වැටුප් ලබන නිලධාරියාගේ නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 10(දහය) ක් සහ අඩු වැටුප් ලබන නිලධාරියාගේ නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 4 (හතර) ක්ද අයකර ගත යුතුය.

5:4:1 ඉන් එක් අයකුට හෝ දෙදෙනාටම හෝ උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් තිබේනම්, වැඩි වැටුප් ලබන නිලධාරියාගේ නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 8(අට) ක්ද, අඩු වැටුප් ලබන නිලධාරියාගෙන් සියයට 2 (දෙකක්) ද අයකර ගතයුතුය.

හවුලේ පදිංචිවීම.

5:5 <u>හවුලේ පදිංචිව සිටින නිලධාරීහු.</u> නිවාස වෙන්කර දෙන බලධාරියාගේ අභිමතය පරිදි නිලධාරීන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි ගණනකට හෝ එක නිවාසයක හවුලේ පදිංචිවීමට අවසර දිය හැකිය. මෙම නිලධාරීන්ගෙන් අයකර ගතයුතු ගෙවල් කුලී පහත සඳහන් පදනම මත තීරණය කළයුතුය.

5:5:1 රජයේ නිවාසයක හවුලේ පදිංචි වන සෑම හවුල් පදිංචිකරුවෙකුගෙන්ම නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 8 (අට) ක් බැගින් අයකරගත යුතුය. ප්‍රධාන බදුකරුගෙන් 5:2:1 හෝ 5:3:1 හෝ උප වගන්තිවල සඳහන් පරිදි නිවාස කුලී අවස්ථාවෝචිත පරිදි අයකරගත යුතුය.

§ 3 ...

ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව.

5:6 <u>ආර්ථික කුලිය.</u> නිලධාරියාගේ වැටුපෙන් අයකරන ගෙවල් කුලිය ඔහුට දී තිබෙන නිවාසයේ සාධාරණ ආර්ථික කුලියට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවූ විට, නිලධාරියාගේ වැටුපෙන් සියයට ගණනක් අයකර ගැනීම වෙනුවට, නියමිත ගෙවල් කුලියක් අයකරගැනීමට, අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අවසර ලබාගත යුතුය. රජයේ කටයුතු සඳහා නිවාසයකින් කොටසක් පාවිච්චි කරන විට කුලිය අඩුකරන ලෙස ලේකම්ගෙන් ඉල්ලීම් කළ හැකිය. එබඳු සෑම අවස්ථාවකදීම කුලිය නියම කිරීමට පෙර, ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලබාගත යුතුය.

නිවාසය ප්‍රතික්ෂේප කළහොත් ගෙවල්කුලී ගෙවීමට බැඳී සිටින බව.

5:7 <u>තනතුරකට නියමිත නිවාසයක් ප්‍රතික්ෂේප කිරීම.</u>
නිලධාරියකු තම තනතුරට නියමිත නිවාසයක පදිංචිවීම ප්‍රතික්ෂේප කරන විටක, ඒ නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියකු එහි පදිංචිවීම නිවාස වෙන්කර දෙන බලධාරියා අනුමත නොකළහොත්, නිවාසය ප්‍රතික්ෂේප කළ නිලධාරියා සැබැවින්ම එහි පදිංචි වූ ලෙස සලකා, ඔහුගෙන් ගෙවල් කුලී අයකර ගත යුතුය. එබඳු අවස්ථාවකදී එම නිවාසය වෙනුවෙන් අයකර ගත යුතු ගෙවල් කුලිය වනුයේ, ඒ නිවාසය හිමි තනතුර දරණ නිලධාරියා ගෙවිය යුතු කුලී ප්‍රමාණය සහ එහි සැබැවින්ම පදිංචිව සිටින නිලධාරියා ගෙවිය යුතු ගෙවල් කුලී ප්‍රමාණය යන දෙකෙන් වැඩි මුදලය.

5:8 <u>වතුර සඳහා ගෙවීම.</u> වතුර පාවිච්චි කිරීම සඳහා අයකරන කවර ගාස්තුවක් වුවද ගෙවීම නිලධාරියාගේ වගකීමකි.

5:9 <u>විදුලිබලය හා ගෑස් සඳහා ගෙවීම.</u> විදුලි බලය හෝ ගෑස් හෝ පාවිච්චි කිරීම සඳහා වන ගාස්තු නිලධාරියා ගෙවිය යුතුය.

02. ආයතන සංග්‍රහයට අදාළ සංශෝධනයන් යථාකාලයේදී නිකුත් කරනු ඇත.

Siriwardhana

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.

රජ/27.